# සාම්ප්‍රදායික සමාජ ව්‍යුහය තුළ පැවති අධ්‍යාපන ක්‍රමය පිළිබඳ සමාජ විද්‍යාත්මක විග්‍රහයක්

ඩබ්. තිළිණි හයසින්ත් දයානන්ද

වසර දෙහෙස් පන්සියයකට ආසන්න කාලයක ලිඛිත සාක්ෂි සහිත ශ්‍රී ලාංකික ශිෂ්ඨාචාරය, ප්‍රබන්ධ සහ ජනප්‍රවාද අනුව දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියයි. අතීතයේ පටන් ශ්‍රී ලංකාව විවිධ ආකාරයෙන් ලොව පුරා ප්‍රචලිත වූ අතර සෑම අතින්ම ස්වර්ණමය යුගයක් ලෙස අනුරාධපුර සහ පොලොන්නරු යුගය ඉතා වැදගත් වේ. අලිඛිත සාක්ෂි හෙවත් ජනප්‍රවාද අනුව රාවණා යුගය මෙරට ස්වර්ණමය යුගය වන බව ප්‍රකාශ වුවත් එය පිළිබඳ සාක්ෂි නොවීම හේතුවෙන් අප මෙහිදී අවධානය යොමු නොකරමු. සාක්ෂි නොවීම එකී ප්‍රබන්ධ අසත්‍ය සේ පිළිගැනීමට හේතුවක් නොවන බව පමණක් සඳහන් කරමු. භූගෝලීය පිහිටීම අනුව ශ්‍රී ලංකාව බතා සුවිශේෂී ලක්ෂණයන්ගෙන් යුක්ත වේ. භාරතයට පමණක් නොව බටහිර සිට නැගෙනහිරට ගමන්ගන්නා මුහුදු මාර්ග ශ්‍රී ලංකාවට ආසන්නයෙන් පැවතීම හේතුවෙන් අතීතයේ පටන් සංක්‍රමණ, ආර්ථික කටයුතු (වෙළෙඳ කටයුතු), යුධ කටයුතු, ආක්‍රමණ ආදී ලෝකයේ සිදුවන ක්‍රියාකාරීත්වයන්ට මුහුණ දීමට සිදු විය. මේ නිසා ශ්‍රී ලංකාව හුදෙකළා වූ රටක් නොව ලෝකයේ සෑම රටක් සමගම අන්‍යෝන්‍ය සබඳතා පැවැත්වූ රාජ්‍යයකි.

ලාංකික ජන සමාජය තුළ දක්නට ලැබෙන සුවිශේෂී සංදිස්ථාන කිහිපයක් ඇත. එම සංදිස්ථාන සංක්‍රමණ, ආක්‍රමණ, වෙළෙඳ කටයුතු, යුධ කටයුතු ආදිය නිසා තීව්‍ර වූ අතර ඒ තුළින් සමාජය ක්‍රමයෙන් වෙනස් වීමට හා සංවර්ධනය වීමට බලපෑවේය. මහාවංශය අනුව ලංකාවේ පළමු සංක්‍රමණය සිදු වන්නේ බුදුරජාණන් වහන්සේ මහියංගනයට වැඩමවීමයි. යක්ෂ ගෝත්‍රිකයන් අතර සිදු වූ යුද්ධය සංසිඳුවීමට බුදුරජාණන් වහන්සේ පළමුවරට ලංකාවට වැඩමවූ අතර මහාවංශයේ මෙම පුවත විජයාවතරණය සඳහා පූර්විකාවක් ලෙස සඳහන්කර ඇත. (විමලවංස, 1988, පිටුව 17) බුදුරදුන් මෙරටට වැඩමවීමට පෙර විසූ යක්ෂ, නාග, දේව වැනි ගෝත්‍ර වැසියන් පිළිබඳ සඳහනක් නොමැත. ආර්යයන්ගේ සංක්‍රමණය ලංකා ඉතිහාසයේ ඉතා සුවිශේෂී සංදිස්ථානයක් වන්නේ ලාංකික රාජ නාමාවලිය ආරම්භ වීම සහ විජය ඇතුළු ආර්ය සංක්‍රමණිකයන් මෙරටට පැමිණ ජනාවාස නිර්මාණය කර ගැනීම නිසාය. එම මොහොතේ කුවේණිය නැමති යක්ෂ ගෝත්‍රික කාන්තාවක් කපු කටිමින් සිටි බවත් ඇය හා විජය විවාහ වූ බවත් සඳහන් වේ. දේශීය ජනතාව රෙදි විවීමේ කටයුතු සිදු කළ බවත්, පාලකයෙකු වීමට දේශීය සහාය්ත්වය වැළඳ ගැනීමේ අවශ්‍යතාවයත් ඉන් ඉස්මතු විය. විජය රජු ඇතුළු පිරිස මෙහි පැමිණ සිංහල ජාතිය බිහි කිරීම සිදු කළ බව විශ්වාස කිරීම නිවැරදි නොවේ. ඔහු සිදු කර ඇත්තේ ආර්ය සංස්කෘතියට අනුව ක්‍රමික රාජ්‍ය පාලනයක් බිහි කිරීම පමණි. (විමලවංස, 1988, පිටුව 18)

විජයාවතරණයේදී 700 ක් පිරිවර සංක්‍රමණය වූ බව සඳහන් වන අතර ඔවුන් විසින් දිවයිනේ විවිධ ප්‍රදේශවල ජනාවාස පිහිටුවා ගන්නා ලදී. අනුරාධගාම, උපතිස්සගාම එවනි ස්ථාන ලෙස ප්‍රචලිත වන අතර ස්වකීය භාරතීය සංස්කෘතියද මෙරටට දායාද කරවන ලදී. ඒ අනුව භාරතීය ආගමික විශ්වාස, සමාජ ස්ථරායන ක්‍රම, පරිපාලන මූලධර්ම මෙලෙස ලංකාවේ ස්ථාපිත කළ බවට

සාක්ෂි හමු වේ. නමුත් විජය පැමිණීමට පෙර මෙරට ජනතාව ප්‍රාථමික හෙවත් ශිෂ්ටාචාර ගත නොවූ පිරිසක් ලෙස සැලකිය නොහැක. ඉන්දු නිම්න අක්ෂර වලට සමාන අක්ෂර ලාංකිකයන් භාවිතා කළ ඇති අතර බ්‍රාහ්මී අක්ෂර ව්‍යවහාර වූ බවටද සාක්ෂි හමු වී ඇත. (ජයවර්ධන, 2015, පිටුව 29)

ලාංකික ජන සමාජය මුහුණ දුන් තවත් සුවිශේෂ සංදිස්ථානයක් වන්නේ මහින්දාගමනයයි. භාරතයේ අධිරාජ්‍යයා වූ අශෝක රජු ස්වකීය ධර්ම දූත සේවාව රටවල් නවයක් පුරා ව්‍යාප්ත කළ අතර ශ්‍රී ලංකාව වෙත ධර්මය ප්‍රචාරය කිරීමේ වගකීම තම පුත් මිහිඳු මහරහතන් වහන්සේට පවරන ලදී. අශෝක රජු සහ එවකට ලංකාවේ රාජ්‍යත්වයට උරුමකම් කී දෙවැනි පෑතිස් රජු අතර පැවති මිතුදම තවදුරටත් ශක්තිමත් විය. මහින්දාගමනය තුළින් සිදු වූයේ බුදුරජාණන් වහන්සේ තෙවරක්ම ලංකාවට වැඩම කර අනුදැන වදාළ ධර්මය නැවත පෝෂණය කරමින් පළමු වරට භික්ෂු ශාසනය පිහිටුවා උපසම්පදා භික්ෂු පරපුරක් බිහි කිරීමය. මහින්දාගමනයට පෙර සිටි සියලු රජවරුන්ට උපදෙස් දීමේ කාර්යය පැවරුණේ පුරෝහිත බ්‍රාහ්මණයෙකුටය. මෙය භාරතීය සංස්කෘතික සම්ප්‍රදාය වූ නමුත් මහින්දාගමනයෙන් පසු රජු බුදු දහම වැළඳ ගැනීමත් සමඟ රජුගේ උපදේශක බවට පත් වූයේ මහා සංඝරත්නයයි. අශෝක රජුගේ දියණිය වූ සංඝමිත්තා තෙරණිය ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාවක් මෙරටට වැඩම කරවන ලද අතර තෙරණිය සමඟ ශිල්ප ශ්‍රේණි 18 ක් සහ කලා ශිල්ප 64 ක පිරිස සංක්‍රමණය විය. ඔවුන් අනුරාධපුරය, පොළොන්නරුව ආදී ප්‍රදේශ වල ව්‍යාප්ත වූ අතර ස්වකීය ඥානය මෙරට වැසියන් සමඟ බෙදා ගත්තේය. එහි ප්‍රතිඵලය වූයේ මෙරට සමාජය ව්‍යුහාත්මකව සහ ගුණාත්මකව ප්‍රබල වෙනසකට ලක් වීමය. මහින්දාගමනය සහ දුමින්දාගමනය ලාංකික සංස්කෘතියේ ස්වර්ණමය සංදිස්ථානයන් වූ අතර පරිපාලන ක්‍රියාවලිය, අධ්‍යාපන ක්‍රියාවලිය, ආර්ථික කටයුතු ඇතුළු සියලු ක්ෂේත්‍රයන් විධිමත් වෙනසකට ලක් විය.

## සාම්ප්‍රදායික සමාජ ව්‍යුහය

ලක්දිව පැවති සමාජ ව්‍යුහය අධ්‍යයනය කිරීමේදී නූතන සමාජ මානව විද්‍යා මූලධර්ම උපයෝගී කර ගනිමින් පැරණි සමාජ කරුණු උකහා ගැනීම සිදු වේ. ඒ අනුව මූලාශ්‍රගත සාධක අධ්‍යයනයේ දී සාම්ප්‍රදායික වර්ගීකරණය අනුව සාහිත්‍යමය සහ පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර වෙත අවධානය යොමු කළ යුතු වේ. රාජකීයයන්, වංශවතුන් සහ සංඝ සංසුථාව අළලා ලියවුණු මූලාශය සහ සාමාන්‍ය ජනජීවිකය හා කෘෂි, වාණිජ ජීවන රටාව පිළිබඳ සාදක එම මූලාශ්‍ර තුළ අනුතර්ගතව ඇත. (හෙට්ටිආරච්චි, 2008, පිටුව 07) මහාවංශය, අට්ඨකථා, මිහින්තලා සහ අභයගිරි වැනි ශිලා ලේඛන, සීගිරි කුරුටු ගීත, සහස්සවත්ථුප්පකරණය වැනි සාහිත්‍යගත සහ පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර අනුව පැරණි ලාංකික සමාජ ව්‍යුහය සරල ස්වයංපෝෂිත වූවක් ලෙස සඳහන් කළ හැකිය. එවක සමාජයේ පැවති සරල බව හුදෙක් ස්වයංපෝෂිතබවින් නිරූපනය විය. පවුල, විවාහය, ඥාතීත්වය, රැකියාව, ආගම, බස්වහර, සංස්කෘතිය, අවශ්‍යතා ආදී සෑම සමාජ ක්‍රියාවලියක්ම අර්ථයෙන් සරල මෙන්ම ස්වයංපෝෂිත විය. මෙම සරල බව සහ ස්වයංපෝෂිතබව ප්‍රකට කරවන සමාජයේ අවියෝජනීය බන්ධනය බවට කුල ක්‍රමය පත් වී තිබුනි.

දකුණු ආසියාතික සමාජය තුළ දක්නට ලැබෙන කුල ක්‍රමය නූතන සමාජ හා මානව විද්‍යාඥයන්ගේ අධ්‍යයනයන්ට ලක් වුවද, ඒ පිළිබඳ පැහැදිලි නිශ්චිත පොදු අර්ථකථනයක් මෙතෙක්

ඉදිරිපත් වී නොමැත. ඇතැම් මානව විද්‍යාඥයින් ඉන්දීය සමාජ සන්දර්භය තුළට ම සුවිශේෂිත වූ සමාජ ප්‍රපංචයක් ලෙස කුල ක්‍රමය හඳුන්වා දීමට උත්සුක වී ඇත. භාරතීය සමාජය තුළ ආගමික සන්දර්භයක් සහිතව කුලය, ධූරාවලි ගත වූ අතර එය හුදු විශ්වාසයක් පමණක් නොව ස්වකීයයන්ගේ පාරිශුද්ධත්වයේ සංකේතයක් ලෙසද සලකනු ලැබීය. දෛනික ජීවිතය සකස් කර ගැනීමේදී කුල රීති, නියෝග සහ සම්ප්‍රදායන්ට ගරු කිරීම එම සමාජය තුළ පැවති අගනාකමකි. අනාදිමත් කාලයක සිට නියම කරන ලද භාෂිතයන් වන බවත්, තමන්ට කිසි දිනෙක එම අගනාකම් අභියෝගයට ලක් කළ නොහැකි ඉරණමක් ලෙසත් ඔවුන් තුළ විශ්වාසයක් පැවතුණි. මෙම විශ්වාසයන් සහිත ආගමික පදනමක් ප්‍රකට කරවමින් භාරතීය හින්දු කුල ක්‍රමය නිශ්චිත ධූරාවලි ගත කිරීමක් සිදු වූ අතර බ්‍රාහ්මණයන් විසින් රචිත ඍග්වේදයෙහි X වන මණ්ඩලයේ 90 සුක්තය තුළින් එය පිළිබිඹු කරවයි.

බ්‍රාහ්මණස්‍ය මුඛමාසිත් - බාහුරාජන්‍ය කෘතඃ
උෟරුතදස්‍යයද් වෛශ්‍ය - පද්භග්‍යාං ක්ෂුද්‍රො අජායතෙ

(ඩයස්, 2003, පිටුව 159)

භාරතීය සමාජය තුළ කුල ධූරාවලියේ ප්‍රභවය පිළිබඳ විශ්වසනීය සාක්ෂියක් බවට පත් වී ඇති සුක්තයට අනුව උසස් කුලය බවට පත් වූ බ්‍රාහ්මණයන්ගේ ප්‍රභවය මහා බ්‍රහ්මයාගේ මුඛය තුළින් සිදු වූ බවත් රාජ්‍යයට අනුසාශනා කිරීම, යාගහෝම ආදී පුදපූජා කටයුතු වල භාරකාරීත්වය දැරීමත් ඔවුන් සතු කුල වගකීමක් ලෙස සලකනු ලැබීය. රාජ්‍ය පාලකයා ක්ෂත්‍රිය කුලයට අයත් වූවෙකු වන අතර එකී කුලය මහා බ්‍රහ්මයාගේ දෙඋරෙන් බිහි වූ බවට විශ්වාසයක් පවතී. වෙළඳ කර්මාන්තයන්හි නියුතු වෛශ්‍ය කුලය මහා බ්‍රහ්මයාගේ දෙදනහිසින් බිහි වූ බවත් ශුද්‍ර කුලය හෙවත් අස්පර්ෂණීය පහත් කුල වල ප්‍රභවය මහා බ්‍රහ්මයාගේ දෙපතුල් වලින් බිහි වූ බවත් එහි ගැබ් වේ. මින් නිර්මිත වූ බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන සිව්වැදෑරුම් කුල ධූරාවලිය සහ හින්දු ආගම භාරතීය සමාජ ව්‍යුහය සකස් වීමේ දී මූලික පදනම බවට පත් විය. (පීරිස්, 1964, පිටුව 185)

ජන සංක්‍රමණයන්හි සිදු වන අවියෝජනීය බැඳීම ප්‍රකට කරවමින් සිදු වන්නා වූ සංස්කෘතික විසරණයෙහි ප්‍රතිඵලයක් ලෙස සංස්කෘතිකාංග තවත් සංස්කෘතියකට ඒකාබද්ධ වී නව සංස්කෘතියක් නිර්මාණය වේ. සංස්කෘතික විසරණය නැමති විශ්වීය ක්‍රියාවලියෙන් සහමුලින්ම විනිර්මුක්ත වීමට ශ්‍රී ලාංකික ජන සමාජයට නොහැකි වූ අතර දිගු කලක සිට භාරතීය සමාජය සමඟ අවියෝජනීය බැඳීමක් පැවති බවට සාක්ෂි දරණ සාධක රැසක් දක ගත හැකිය. භාරතය සමඟ සිදු වූ සංක්‍රමණයන් හේතුවෙන් සිංහල ජන සමාජයට බල පවත්නා සංස්කෘතිකාංග රැසක් විසරණය වූ අතර එකී ජන සමාජ ක්‍රමය තුළ ප්‍රබල වෙනසක් සිදු කිරීමට කුල ක්‍රමය නැමති සංස්කෘතිකාංගය හේතු විය. භාරතීය සමාජය තුළින් මෙරටට දායාද වූ කුල සම්ප්‍රදාය මෙරට ජන සමාජයටම ආවේනික වූ ක්‍රමයක් ලෙස ප්‍රතිනිර්මාණය විය. සිංහල කුල ක්‍රමය, භාරතීය කුල ක්‍රමය මෙන් මුළුමනින්ම ආගම මත පදනම් නොවූ අතර මෙරට සමාජ ක්‍රමය තුළ ශ්‍රම විභජනය පදනම් කර ගත් කුල ක්‍රමයක් ලෙස නිර්මාණය වී ඇත. (ඩයස්, 2003. පිටුව 160)

සිංහල කුල ක්‍රමය සහ බුදු දහම අතර ඇති සබඳතාවය, භාරතීය කුල ක්‍රමය සහ හින්දු ආගම මෙන් සෘජු සබඳතාවයකින් යුක්ත වූවක් නොවීය. බුදු දහම, ධර්මානුකූල සහ දාර්ශනික

මත වාදයක් ලෙස ගත් විට කුල ක්‍රමයට විරුද්ධය. බුද්ධ දේශනා වල සඳහන් වසල සූත්‍රයේදී කුල ක්‍රමය විවේචනයට ලක් වූ අතර වර්තමානයේ බෞද්ධ සංස්කෘතිකාංගයන්හිදී කුල ක්‍රමය යම් උපයෝගීතාවයක් ලෙස ගෙන ඇත. ආගමික පදනමක් මත බිහි වූ හින්දු කුල ක්‍රමය පවිත්‍රතා සංකල්පයක් ලෙස භාරතීය ජන සමාජය පුරා ව්‍යාප්ත වී පැවතියද සිංහල කුල ක්‍රමය දෙස බලන විට පවිත්‍රතා සංකල්පයට වැදගත් තැනක් ලබා දී නොමැත. සිංහල කුල ක්‍රමයේදී ආර්ථික සාධකයටත් සමාජ ප්‍රභූත්වයටත් වැදගත්කමක් ලබා දී ඇත. මෙවැනි තත්වයකට හේතු වූයේ මෙරට කුල ක්‍රමය විකාශනය වූයේ වැඩවසම් සමාජ ක්‍රමයක් තුළ වීම යැයි විශ්වාස කළ හැකිය. (පීරිස්, 1964, පිටුව 185) සිංහල කුල ක්‍රමය තුළ සේවා කුල (සේවයේ යෙදී සිටින කුල) සහ සේවා ලබන කුල වශයෙන් ස්ථර දෙකක් දක්නට ලැබේ. උඩරට රාජධානිය තුළ රාජ්‍ය පරිපාලනයේ උසස් තනතුරු සීමා වූයේ රදළ පෙලපත්වලටය. ඔවුන් සේවා ලබන කුලය වූ අතර සේවා කුල වලට පැවරී තිබුණේ රදළ ප්‍රභූන් වෙනුවෙන් විවිධ සේවාවන් සැපයීමයි. ඉඩම් බුක්ති ක්‍රමය මත පදනම් වූ වැඩවසම් සමාජයේ රදළයන් සඳහා ඉඩමෙහි වැඩි අයිතියක් හිමි වූ අතර අනෙක් කුලයන්ට ඉඩම් පවරා දීම සිදු වූයේ රාජකාරී ක්‍රමයට අනුව සේවා සැපයීම සඳහාය. මෙම සමාජ ව්‍යුහය තුළින් තහවුරු වන්නේ භාරතීය කුල ක්‍රමයේ ප්‍රභවයට හින්දු ආගමික විශ්වාස පදනම් වූවාසේම සිංහල කුල ක්‍රමයේ ප්‍රභවයට වැඩවසම් සමාජ ක්‍රමය සහ එහි පරිපාලන ව්‍යුහය පදනම් වූ බවයි. මෙලෙස විධිමත් පරිපාලන ව්‍යුහයක් මගින් එකල සමාජ ක්‍රමයේ පැවැත්ම තහවුරු විය. (ජයවර්ධන, 2008, පිටුව 84)

## ලංකාවේ පැරණි දේශීය අධ්‍යාපනය

විජය ඇතුළු ආර්යයන් ලංකාවට සංක්‍රමණය වීමට පෙර පටන් ලංකාවේ ජනාවාස පැවති බවටත්, ඔවුන් තුළ අක්ෂර ව්‍යවහාර පැවති බවටත් සාක්ෂි හමු වේ. අශෝක සෙල් ලිපිවල සඳහන් නොවන අක්ෂර කිහිපයක් ලාංකික සෙල් ලිපි වල ඇත. එයින් ''ඉ'', ''ම'', ''ඣ'' යන අක්ෂර ප්‍රධාන වේ. (විමලවංස, 1988, පිටුව 19) එසේම ඉන්දු නිම්න අක්ෂර වලට සමාජ සංකේත ද භාවිත කර ඇත. මෙයින් පෙනී යන්නේ වංශ කතා සහ මුඛ පරම්පරාගත ජනකථා වල සඳහන් සාක්ෂි වලට අමතරව ලේඛනගත විද්‍යාත්මක සාක්ෂි අනුව විජයාවතරණයට පෙර මෙරට භාෂාව සහ අක්ෂර භාවිතය දියුණු තත්වයක පැවති බවයි. කෙසේ වෙතත්, ලංකාවේ පැරණි දේශීය අධ්‍යාපනයෙහි ආරම්භය පිළිබඳව නිතය සාක්ෂි නොමැති වුවද, විධිමත් අධ්‍යාපන ක්‍රමයක ආරම්භය සනිටුහන් වන්නේ මිහිඳු හිමියන්ගේ වැඩමවීමෙන් පසුවය. (ජයවර්ධන, 2015, පිටුව 01) ඒ අනුව, මෙරට පැරණි විධිමත් අධ්‍යාපන ක්‍රමයට බුදුදහමේ ආභාෂය ලබා ඇති බව නොරහසකි. භාරතයේ පැවති බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදායට බොහෝ සෙයින් සමානව ක්‍රියාත්මක වුවද, ලංකාවේ පැරණි අධ්‍යාපන ක්‍රමය ශ්‍රී ලාංකේය අනන්‍යතාවයක් සහිතව ක්‍රියාත්මක වී ඇති බවද නොරහසකි.

දේවානම්පියතිස්ස රජුගේ උතුරු ඉන්දියානු හිත මිත්‍රකම් වර්ධනය වීමේ ප්‍රතිඵලය වූයේ ඉතා වේගයෙන් බුදු දහම රට පුරා පැතිරීමයි. භික්ෂූන් වහන්සේලාගේ නිත්‍ය වාසය අනුරාධපුරය මුල් කරගෙන පැවතුනි. රටේ අගනුවර අනුරාධපුරය වූ නිසාත්, ඔටුණුපළන් රජුන්ගේ වාසය අනුරාධපුරයේම වූ නිසාත් මහා විහරය මෙරට ආගමික මූලස්ථානය විය. ථේරවාදී බුදු දහමේ පෙරදිග ප්‍රධාන මධ්‍යස්ථානය වූයේ ද මහා විහාරයයි. ථේරවාදී ඉගැන්වීම් ක්‍රමවේද රැක ගැනීමටත්,

දියුණු කීමටත් කටයුතු කරන ලද්දේ මහා විහාරය වන අතර මහායාන සම්ප්‍රදාය පදනම් කර ගත් අධ්‍යාපන ක්‍රමයක් ජේතවනය සහ අභයගිරිය කේන්ද්‍ර කරගෙන ක්‍රියාත්මක විය. මෙයින් පෙනී යන්නේ මහාවිහාර සම්ප්‍රදාය තෝකෝත්තර කරුණු මත ඉගැන්වීම් සිදු කළ අතර ඔවුන් ලෞකික කරුණු කෙරෙහි අවධානය අඩුවෙන් යොමු කළ බවයි. එසේ වුවත්, මහායානික සම්ප්‍රදාය ගුරු කොට ගත් අභයගිරි සහ ජේතවන නිකායිකයින් ලෝකෝත්තර කරුණු වලට වඩා ලෞකික කරුණු වෙත අවධානය යොමු කර ඇත. එය වඩාත් ජනප්‍රිය වූ අතර ගිහි අධ්‍යාපනයට අවශ්‍ය ලෞකික විෂයන් රැසක් උගන්වා ඇති බවයි.

වර්තමාන අධ්‍යාපන ක්‍රමවේදය පිළිබඳ අධ්‍යයනයේ දී ලෝකයේ බොහෝ රටවල් වල ක්‍රියාත්මක වන්නේ පොදු ක්‍රමවේදයකි. එම තත්වය අයදතනයේ පමණක් නොව අතීතයේ ද එලෙෂ ක්‍රියාත්මක වී පැවති අතර ලංකාවේ ද පැරණි දේශීය අධ්‍යාපන ක්‍රමය ප්‍රධාන කොටස් 3 කින් යුක්ත වේ.

1. ප්‍රාථමික අධ්‍යාපනය
2. ද්විතියික අධ්‍යාපනය
3. තෘතියික අධ්‍යාපනය

## ප්‍රාථමික අධ්‍යාපනය

සාම්ප්‍රදායික පැරණි ලාංකික සමාජයේ ප්‍රාථමික අධ්‍යාපනය සියලු දෙනාටම අනිවාරය වූ අතර එය බල කිරීමකින් තොරව දෙමාපිය වගකීමක් ලෙස ක්‍රියාත්මක විය. ශාස්ත්‍රොත්ග්‍රහණය සඳහා දරුවන් යොමු වී ඇත්තේ වයස අවුරුදු 5 දී බව සද්ධර්මාලංකාරයේ සඳහන් වේ. (ජයවර්ධන, 2015, පිටුව 03) ''ක්‍රමයෙන් වැඩී ශික්ෂා ග්‍රහණ කාලය සම්ප්‍රාප්ත විය. එකල මේ ලංකාද්වීපයේ මනුශ්‍යයෝ පස් ඇවිරිදි කුමාරවරුන් තම තමන් විභවානුරූපව නොයෙක් ආභරණයෙන් සරසා මහත් වූ මඟුලෙන් ශිෂා ග්‍රහණය කරවති'' (සද්ධර්මාලංකාරය, පිටුව 436)

ඉගෙනීම සඳහා ධනවත් හෝ දුප්පත් ලෙස භේදයක් නොවූ බව පැහැදිලි කරුණකි. භාරතීය සමාජයේ ශාස්ත්‍ර ග්‍රහණය උරුම වූයේ ප්‍රධාන වශයෙන් බ්‍රාහ්මණ කුලයට පමණි. රාජ්‍ය පාලන ක්ෂත්‍රිය කුලයටද ශිල්ප ශාස්ත්‍ර ග්‍රුණයට අවසර පැවතිය ද පහත් කුලය වූ ක්‍ෂුද්‍රයන්ට එය තහනම් විය. නමුත් ලංකාවේ මෙම තත්වය සහමුලින්ම වෙනස් වූ අතර අවුරුදු 5 සම්පූර්ණ වූ සියලු දරුවන්ද ඉගෙනුම් අවස්ථා උදා විය. පූජාවලියේ සඳහන් වන්නේ ''අකුරු නොදත් මව මෙන්ම ශිල්ප ශාස්ත්‍ර නොදත් මව ලැජ්ජාවට කරුණක් වේ'' යන්නයි.

ප්‍රාථමික අධ්‍යාපනය ලබා දුන් ප්‍රධාන ආයතනය වූයේ ''ගුරු ගෙදර'' ය. එහි විෂයමාලාවට සෞඛ්‍ය, සිරිත් විරිත්, ආගම, පරිසරය, අකුරු කරවීම වැනි විෂයන් ඇතුළත්ව පැවති බව සඳහන් වේ. (විමලවංස, 1988, පිටුව 41) ප්‍රාථමික අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණ වූයේ රටට අවශ්‍යකරන යහපත් පුරවැසියෙකු නිර්මාණය කිරීමයි. ඒ සඳහා වර්ෂ 7 ක පූර්ණ අධ්‍යාපන ක්‍රමයක් ක්‍රියාත්මක වූ අතර ප්‍රාථමික අධ්‍යාපනය අවසන් වන්නේ වර්ෂ 12 දීය. ගුරු ගෙදර අධ්‍යාපනය නේවාසික අධ්‍යාපන ආයතනයක් වූ අතර එහිදී ගුරුතුමා ශාස්ත්‍රීය අධ්‍යාපනයක් ලබා දීමට කටයුතු

කළ අතර ගුරු මාතාව අවිධිමත් අධ්‍යාපනයක් ලබා දෙන ලදී. මේ නිසා විධිමත් ලෙස ශාස්ත්‍රීය විෂයන් මෙන්ම අවිධිමත් ලෙස සාමාන්‍ය දිවි පැවැත්මට අවශ්‍ය කරුණු ද ගුරු ගෙදරින් දරුවා උකහා ගන්නා ලදී. ගුරු මාතාව තම දෛනික කටයුතු සඳහා ශාස්ත්‍රෝත්ග්‍රහණයට පැමිණි දරුවන් යොදාවා ගනිමින් සහයෝගීත්වය, දොඳ නරක, ශිල්පීය උපක්‍රම, අන්‍යයන් හඳුනා ගැනීම වැනි කරුණු වලට අවිධිමත්ව හුරු කරවන ලදී. ඉගෙනුමෙහි වැඩි දායකත්වය අවිධිමත් අධ්‍යාපනය ෂතු වීමෙන් පෙනී යන්නේ ගුරු ගෙදර ප්‍රාථමික අධ්‍යාපනය මනා පෞරුෂයකට අවශ්‍ය ගුණාංග සර්ව සම්පූර්ණ කර ඇති බවයි.

සිරිත් විරිත් සහ සාරධර්ම ප්‍රාථමික සිසුන් වෙත ඉගැන්වීම සඳහා වදන් කවිපොත භාවිතා කර ඇත. ''දත මැද පිරුවට ඇඳ පේ වෙන්නේ'' යන පද්‍ය මෙන්ම ''ගුරුවර පහත් බැස වැඳ, දෙගුරුන් නැමී වැඳ'' යනුවෙන් දක්වා තිබීමෙන් පෙනී යන්නේ ප්‍රාථමික් අධ්‍යාපනය සඳහා යොදා ගත් පොත පත සාරධර්ම කෙරෙහිම යොමු වී ඇති බවයි. බුත්සරණ ග්‍රන්ථයට අනුව දරුවන් ක්‍රීඩා මගින් ඉගෙනුම ලබා ඇති බව පෙනේ. සෙල්ලම් වලං, ඇතුන්, අසුන්, රථ ආදිය යොදාගෙන ඇත. විශේෂක්වය වන්නේ ඔවුන්ගේ ක්‍රීඩා උපකරණ ඔවුන් විසින්ම සාදා ගැනීමයි. ඒ තුළින් ඉවසීම සහ හික්මීම අරමුණු කළ අතර කායික සහ මානසික සංයමය අපේක්ෂා කර ඇත. ප්‍රාථමික අධ්‍යාපනය තුළ පරිසර අධ්‍යාපනය සඳහා හිමි වූයේ ඉතා ඉහළ වැදගත්කමකි. ''නම් පොත'' ලෙස භාවිත කළ ඉගෙනුම් උපකරණය ඉතා විශේෂ වූ අතර එය ශාස්ත්‍රීය කාර්යයක් ලෙස අකුරු ලිවීමටත්, අකුරු කියවීමටත්, අකුරු උච්ඡාරණය කිරීමටත් භාවිත කළ අතර භූගෝල විද්‍යා ග්‍රන්ථයක් ලෙසත් භාවිත කර ඇත. නම් පොතෙහි ලංකාවේ ග්‍රාම නාම, නගර නාම, ප්‍රධාන බෞද්ධ මධ්‍යස්ථානවල පිහිටි ස්ථාන සඳහන් කර ඇත. මෙම පොත කියවීමෙන් ප්‍රධාන ස්ථාන, ගම්, නගර මතකයේ රැඳෙන අතර ඒවායේ සුවිශේෂත්වයද ස්මරණය වේ. වර්තමාන අධ්‍යාපන මූලධර්මයක් වන දන්නා දෙයින් නොදන්නා දෙය කරා යාම හෙවත් සරල දෙයින් සංකීර්ණ දෙය කරා යාමේ ක්‍රමය අනුගමනය කිරමින් රචිත වටිනා ග්‍රන්ථයක් ලෙස නම්පොත සැලකෙයි. සරල අක්ෂරවල සිට මහප්‍රාණ අක්ෂර දක්වා වචන යොදා ඇති අතර එහි විශේෂත්වය වන්නේ සිංහල හෝඩියේ සියළු අක්ෂර නියෝජනය වන ආකාරයට නම් ඇතුළත් කර තිබීමයි. (ජයවර්ධන, 2015, පිටුව 05)

අනුරාධපුරයේ සිටම අධ්‍යාපනය සඳහා භාවිත කර ඇති සියලු පොත් පිළිබඳ නිවැරදි විස්තරයක් මෙතෙක් සඳහන් වී නොමැත. විදේශ ආක්‍රමණ රැසකට ලංකාව හසු වීමත්, ඔවුන් විසින් පොත් ගිනි තැබීමත් හේතුවෙන් මෙම තත්වය උදා වී ඇතැයි සැලකේ. කෙසේ වෙතත් ''ගණදෙවි හැල්ල'' ලෙස සඳහන් ග්‍රන්ථය ප්‍රාථමික අධ්‍යාපනයේදී භාවිත කළායයි සැලකෙන ග්‍රන්ථවල විස්තරයක් දක්වා ඇත.

1. හෝඩිය
2. නම්පොත
3. සැහැලි
4. බුද්ධගජ්ජය
5. ඇනවුම් ග්‍රන්ථ
6. සකස්කඩ

7. ශතක පොත් (විමලවංස, 1988, පිටුව 40)

ප්‍රාථමික අධ්‍යාපනය ලබා දුන් ගුරුගෙදර, අධ්‍යාපනයේ දී විවිධ උපකරණ භාවිත කර ඇත. වැලි පිල හෙවත් වැලි පිල්ල, වැලි, වැලිපත, පන්හිද, තල්පත, පුස්කොළය, හෝඩිය, පෙළ පොත් භාවිත වූ අතර කාලයට අදාළවන පරිදි පෙළ පොත් වෙනස් කර ඇත. ගුරු ගෙදර ගුරුතුමාගේ මඟ පෙන්වීම යටතේ සියළු දරුවන් අකුරු ලිවීම හුරු වූ අතර දරුවන් ක්‍රමයෙන් ලේඛන කලාව වෙත යොමු විය. ශ්‍රවණයට ප්‍රධාන තරනක් ලබා දුන් අතර ''වනපොත් කිරීම'' හෙවත් කටපාඩම් කිරීම ප්‍රධාන ඥාන මාර්ගය විය. ගුරුවරයා කියන දෙය හෝ පොත්වල කියවන දෙය නිතර කියවීමෙන් මතක තබා ගත යුතු විය. මේ අනුව කියවීම මෙන්ම ස්මෘතියද ඉතා වැදගත් ඉගෙනුම් ක්‍රම ශිල්පයක් විය.

ප්‍රාථමික අධ්‍යාපනය ලබන පුරා වසර 07 ක කාලයක් තුළ දරුවාට අනාගතයේ දී අවශ්‍යකරන සියලු කාර්යයන්ට අදාළ ශාස්ත්‍රීය පුහුණුව ලබා දීමට කටයුතු කර ඇති බව පෙනේ. එය හුදෙක් ශාස්ත්‍රීය අධ්‍යාපනයක් පමණක් නොව ශිල්පීය අධ්‍යාපනයක් ද විය. මෙම ප්‍රාථමික අධ්‍යාපන වසර 07 තුළ දරුවා ලබන අධ්‍යාපනය ඉදිරි අධ්‍යාපන අවස්ථාවන්ට ලබා දෙන්නේ මහත් පිටිවහලකි.

**ද්විතියික අධ්‍යාපනය**

සියලු දරුවන්ට උරුම වූ ප්‍රාථමික අධ්‍යාපනය අවසන් කළ පසු නව යොවුන් වියත් සමඟ ද්විතියික අධ්‍යාපන අවස්ථාවට පත් වේ. මෙම අධ්‍යාපනය ප්‍රධාන අංශ දෙකකින් ක්‍රියාත්මක වේ.

01. පවුල පදනම් කරගත් ශිල්ප ශ්‍රේණි (කුල) අධ්‍යාපනය
02. පන්සල් පාසල

සාම්ප්‍රදායික සමාජයේ ක්‍රියාත්මක වූ ශිල්ප ශ්‍රේණි ක්‍රමය පදනම් කරගත් ලාංකේය කුල ක්‍රමය තුළ අරමුණ වූයේ ග්‍රාමීය අවශ්‍යතා සර්ව සම්පූර්ණ කර ගැනීමයි. ඒ අනුව සෑම පුද්ගලයෙකුම කුමන හෝ කුලයකට අයත් විය. එනම් ශිල්ප ශ්‍රේණියකට අයත් වූ අතර එය පවුලේ වගකීමක් ලෙස ක්‍රියාත්මක විය. පවුලේ ශිල්ප උරුමය පරම්පරාවෙන් පරම්පරාවට උරුම වූ අතර ශිල්ප රහස් ද එලේස පවුලට පමණක් සීමා විය. එම නිසා ප්‍රාථමික අධ්‍යාපනය අවසන් කළ සෑම දරුවෙක් ම ස්වකීය පවුලට අයත් කර්මාන්තයේ කටයුතු කිරීමට යොමු විය. කුඩා කල පටන් ලබන අත් දැකීම් සහ ප්‍රායෝගික දැනුම හේතුවෙන් පවුල ආශ්‍රිතව ශිල්ප ශ්‍රේණි තුළින් ලබන ඉගෙනුම ඉතා වැදගත් විය. වෘත්තීය නිපුණතාව පමණක් නොව වෘත්තීය ලැදියාවද මේ තුළ දක්නට ලැබුනි. එමනිසා සාර්ථක සමාජයක් නිර්මාණය වීමට පවුල අයත් ද්විතියික අධ්‍යාපන ඒකකය ප්‍රබල දායකත්වයක් දක්වා ඇත. ඒබ ව දීර්ඝ වූ විස්තරයක් මෙම ලිපියේ පූර්ව භාගයේ සඳහන් වේ.

පන්සල් පාසල යනු ද්විතියික අධ්‍යාපනයේ අනෙක් අංශයයි. මිහිඳු හිමියන්ගේ වැඩමවීමත් සමඟ පන්සල ධර්ම අවබෝධය ලබාදෙන මධ්‍යස්ථානය විය. ශික්ෂණය පමණක් නොව ශිල්පීය අධ්‍යාපනය ලබා දීමට ප්‍රමුඛත්වය ගෙන කටයුතු කර ඇත. බෝහෝ පන්සල් අතීතයේ දී ද්විතියික අධ්‍යාපනය ලබා දුන් මධ්‍යස්ථාන ලෙස සැලකේ. ළමාවිය පිළිබඳ මනා අවබෝධයක් ඇති

ගිහියෙකු විසින් ගුරුගෙදර ප්‍රාථමික අධ්‍යාපනය ලබා දුන් නමුත් ද්විතියික අධ්‍යාපනයේ දී නව යෞවනයාගේ හෙවත් තරුණයාගේ වගකීම භාර වූයේ පන්සලේ භික්ෂුවටය. පන්සල් පාසල වෙත අධ්‍යාපන කටයුතු වලට සහභාගී වූවන් ඒ සඳහා ආශාවක් සහ අවශ්‍යතාවක් ඇති පිරිස පමණක් වීමෙන් පෙනී යන්නේ පන්සල් පාසල් අධ්‍යාපනය අනිවාර්ය නොවූ බවයි. රාජ කුමාරවරු, පාලකයන්, ඇමතිවරු, ප්‍රාදේශීය පාලකයන්, වෛද්‍යවරු වීමට කැමති, ජෝතිෂකරුවන් වීමට කැමති, ගුරුවරු වීමට කැමති අය මෙන්ම උසස් අධ්‍යාපනට කැමති අය මෙම පන්සල් පාසලට යොමු විය. මෙම ආයතනයේ විධිමත් විෂයමාලාවක් භාවිත කර ඇති අතර රජු විසින් පන්සල් පාසල් වෙත විවිධ පරිත්‍යාග සිදු කර ඇත. ඉගෙනීමට පැමිණි අය විසින් විවිධ ගෙවීම් සිදු කර ඇති බවත්, රජවරු විසින් නින්දගම් ලබා දී ඇති බවත් සෙල් ලිපිවල සඳහන් වේ. (ජයවර්ධන, 2015, යිටුව 15) මෙම පාසලේ සියළු ඉගැන්වීමේ කාර්යයන් සිදු කරන ලද්දේ භික්ෂූන් විසින් වීමද විශේෂ ලක්ෂණයකි. පාලි, සංස්කෘත, චීන, දෙමළ, චන්දස්අලංකාරය, ව්‍යාකරණ, ඉතිහාසය, අංක ගණිතය, සාහිත්‍යය, භූගෝල විද්‍යාව, ජෝතිෂය, වෛද්‍ය විද්‍යාව, ගුප්ත විද්‍යාව වැනි විෂයන් උගන්වා ඇත. වෛද්‍ය විද්‍යාව වැනි විෂයන් මෙම පාසලේ උගන්වා ඇත්තේ එදිනෙදා ජීවිදයට අවශ්‍යකරන කරුණු සඳහා පමණි. උපාධි මට්ටමට උගන්වා නැත. එය වෙනම ක්ෂේත්‍රයකි. පන්සල් පාසල හැඳින්වීම සඳහා ''පිරිවෙන'' යන පදය භාවිත කර ඇති නමුත් උපාධි මට්ටමේ ඉගැන්වීම් කළ ආයතන ද, අතීතයේ පිරිවෙන ලෙස නම් කර ඇති බැවින් ද්විතියික අධ්‍යාපන ආයතනය ''පන්සල් පාසල'' ලෙසම ව්‍යවහාර කිරීම වඩාත් උචිත බව හැඟේ.

**තෘතියික අධ්‍යාපනය**

ලංකා ඉතිහාසය පරීක්ෂා කිරීමේ දී මෙරට තෘතියික අධ්‍යාපනය ඉතා ඉහළ මට්ටමකින් පැවතී ඇති බව පෙනෙයි. වෝහාරිකතිස්ස රජුගේ පුත් ආරියදේව හාමුදුරුවන් ලංකාවේ අභයගිරි විශ්වවිද්‍යාලයෙන් ඉගේන ගෙන ඉන්දියාවේ නාලන්දා විශ්වවිද්‍යාලයට ගොස් එහිදී ද උපාධි හදාරා එම විශ්වවිද්‍යාලයේ ම උප කුලපති තනතුර ලබා ඇත. ඉපැරණි ලංකාවේ ප්‍රධාන වශයෙන් තෘතියික අධ්‍යාපනය ලබා දුන් ආයතන දෙකකි.

01. ථේරවාදී විශ්වවිද්‍යාල
02. මහායාන විශ්වවිද්‍යාල

තේරවාදී විශ්වවිද්‍යාලය ක්‍රියාත්මක වූයේ මහා විහරය කේන්ද්‍ර කරගෙන ය. මෙම ආයතනයේ ඉගැන්වීම් මුල් බුදු දහම මත පදනම් වූ අතර ශුද්ධ බුදු දහම පිළිබඳ පර්යේෂණ සිදු කිරීම, නඩත්තු කිරීම, ව්‍යාප්ත කිරීම වැ, සකදාගාමී, අනාගාමී, අරහත් ඵලයට පත් වීමට අවශ්‍ය ධර්ම කරුණු ඉගැන්වීමට යොමු විය. ලෞකික විෂය කරුණු වලට වඩා ලෝකෝත්තර කරුණු කෙරෙහි අවධානය යොමු කළ අතර පරම අරමුණ වූයේ චතුරාර්ය සත්‍යය අවබෝධ කරවීමය. පාලි සහ සංස්කෘත භාෂාවන් ඉගැන්වූ අතර මහායාන ධර්ම කරුණු ඉගැන්වීම සිදු නොකළ බැවින් මහාවිහාර විශ්වවිද්‍යාලය වඩාත් ජනප්‍රිය වූයේ නැත. මහාවිහාරයේ අනුබද්ධිත ආයතන පැවති බවටද සාක්ෂි ඇත. චිත්තල පබ්බත හෙවත් සිතුල්පව්ව එවැනි ආයතනයක් ලෙස ප්‍රකටය.

මහායාන විශ්වවිද්‍යාලය පැවතියේ ජේතවනාරාමය සහ අභයගිරිය ආශ්‍රයෙනි. මහායානිකයන්ගේ අරමුණ වූයේ නිවන් දැකීමට නම් සෑම අයෙක්ම බෝධිසත්ව ගුණාංග වර්ධනය කළ යුතු බවයි. ඒ අනුව මහායානිකයන් විසින් ගරු කරන ලද බෝධිසත්ව ගුණාංග 05 ක් ඇති බව සෙනරත් පරණවිතාන මහතා සඳහන් කර ඇත.

1. භාෂාව සහ ව්‍යාකරණ හුරුව
2. තර්ක ශාස්ත්‍රය

මෙම ගුණාංග දෙක වර්ධනය කර ගැනීමේ අවශ්‍යතාව දක්වා ඇත්තේ ප්‍රසිද්ධ මතවාද සහ දැනුම ලබා ගැනීම සඳහාය. පරාර්ථ චර්යාව ද බෝධිසත්ව ගුණාංග ලෙස දක්වා ඇති බැවින් පහත සඳහන් විෂයන් දෙක හදාරා ඇත.

3. වෛද්‍ය විද්‍යාව
4. ශිල්ප

තම යහපත උදෙසා සහ කිසියම් පිළිවෙතක කටයුතු කිරීම සඳහා අනෙක් විෂය හදාළ යුතු විය. එය,

5. දර්ශනවාද වේ.

(ජයවර්ධන, 2015, පිටුව 17)

මෙයින් නිරූපණය කර ඇත්තේ බෝධිසත්වයෙකු තුළ ඉතා ඉහළ දැනුමක් පැවතිය යුතු බවයි. ලක්දිව අතීතයේ පැවති මෙම කරුණු පිළිබඳ බටහිර කිසිදු අධ්‍යාපන ක්‍රමයක පැවතී නැති බව පෙනී ගොස් ඇත. මෙම විශ්වවිද්‍යාල ලෝකෝත්තර කරුණු වලට වඩා ලෞකික විෂය කරුණු උගන්වන ලදී. පාලි භාෂාවට වඩා සංස්කෘත භාෂාවට වැඩි වටිනාකමක් හිමි විය. ඒ අනුව මහායාන විෂයමාලාව වඩාත් ජනප්‍රිය විය. ජනතාවගේ ආකර්ෂණය වැඩි විය. කලා නිර්මාණ, වාරි තාක්ෂණය, පිළිම නිර්මාණ, සඳකඩ පහණ වැනි නිර්මාණ බිහි විය. ථේරවාදී බුදු දහමද උගන්වා ඇති බව පෙනේ. මෙම විශ්වවිද්‍යාලවල පැවති විෂයමාලාවන් අතර සාහිත්‍යය, තර්ක ශාස්ත්‍රය, ගණිතය, සිව්සැට කලා, රාජ නීති, ධර්ම නීති, ධනු ශිල්පය, දාගැබ් කර්මාන්තය, ලෝහ කර්මාන්තය, නාවික කර්මාන්තය, අෂ්ඨ විද්‍යා ශිල්ප, වෛද්‍ය විද්‍යාව, බෞද්ධ දර්ශනය, සංගීතය, ප්‍රජා සෞඛ්‍යය, ලෝක නීතිය, ඡන්දස්අලංකාරය අයත් විය.

අභයගිරි විශ්වවිද්‍යාලය තුළින් ලෝහ උඳුන් 12 ක් හමු වී ඇති අතර එහි ලෝහ කර්මාන්තශාලාවක් පැවති බවට සාක්ෂි හමු වේ. කාසි නිර්මාණය කළ අච්චු හමු වී ඇති බැවින් පෙනී යන්නේ රජු ස්වකීය පූර්ණ විශ්වාසය මෙම ආයතන වෙත තබා ඇති බවයි. අභයගිරියේ උත්තර මූලයේ සහ දක්ෂිණ මූලයේ ඇති සෙල් ලිපි වලින් අභයගිරියේ ඉංජිනේරු පීඨයක් පැවතී ඇත. විවිධ වර්ගවල ධාන්‍ය හමු වීමෙන් පෙනී යන්නේ පරාග විද්‍යාව ඉගැන්වූ කෘෂි විද්‍යා පීඨයක් පැවති බවයි. වෛද්‍ය උපකරණ හමු වීමත්, සෙල්ලිපි වල සඳහන් පරිදි ප්‍රදේශයේ මිය යන සතුන් සහ මිනිසුන්ගේ දේහ විශ්වවිද්‍යාලයට භාර දීමෙන් පෙනී යන්නේ ශික්ෂණ රෝහලක් පැවති බවයි. සතුන් කපා පශු වෛද්‍ය විද්‍යාවත්, මිනිසුන් කපා මිනිසුන් පිළිබඳ වෛද්‍ය විද්‍යාවත් හදාරා ඇත. විශ්වවිද්‍යාලයේ දෛනික කාලසටහන සකස් වී ඇත්තේ භික්ෂූන් වහන්සේගේ දින චර්යාවට අදාළව

වීමෙන් පෙනී යන්නේ විශ්වවිද්‍යාලයේ ආචාරයවරු බවට පත් වී ඇත්තේත්, අධ්‍යයන කටයුතු සිදුකර ඇත්තේත වැඩි පිරිස භික්ෂූන් වන බවයි. (විමලවංස, 1988, පිටුව 29)

විශ්වවිද්‍යාලයෙන් ලබන ශාස්ත්‍රීය අධ්‍යාපනයට අමතරව ඔවුන් සියළුදෙනා ප්‍රායෝගික කාර්යයන් වෙත යොමු වී ඇත. වර්තමාන අධ්‍යාපන ක්‍රමයේ දී ශිල්පීය අවස්ථාවන්ට මද ඉඩක් පමණක් හිමි වුවද, අතීත ලංකාවේ පැවත් දේශීය අධ්‍යාපන ක්‍රමය ශිල්ප සහ ශාස්ත්‍ර යන අංශ දෙක සමබරව ගෙන යාමට දක්ෂ වී ඇත. ඒබ ව සීගිරිය දෙස බැලීමේ දී පෙනී යයි. (ජයවර්ධන, 2015, පිටුව 21) සමස්ථ සීගිරිය තුළින්ම විද්‍යමාන වන්නේ ශ්‍රී ලංකාවේ පැවති අධ්‍යාපනයයි. ඉතා ඉහළ මට්ටමේ අධ්‍යාපනයක් නොමැති වූයේ නම් සීගිරිය නිර්මාණය කළ හැකි ශිල්පීන් බිහි නොවනු ඇත. සීගිරි ගීත වලින් 95% ක් පමණ, එනම් ගීත වලින් 600 ක් පමණ "එළුසඳැස් විරිතට" අනුව නිර්මාණය වී ඇත. මෙයින් පෙනී යන්නේ ප්‍රාථමික අධ්‍යාපනය සහ ද්විතියික අධ්‍යාපනය සඳහා භාවිත කළ විශේෂ අත් පොතක් වූ බවත්, සියළු ජනතාව එය හොඳින් ප්‍රගුණ කර ඇති බවත් ය. නූගත් යයි කිව හැකි ජන කොටසක් ඒ අනුව මෙරට සිට නැති බව පෙනී යයි.

ජල උද්‍යානය, ඇතුළත සහ පිටත උද්‍යාන, චිත්‍ර, ගොඩනැගිලි සහ ආරක්ෂබ මුරකාවල් ආදිය දෙස බලන විට ඉංජිනේරු ශිල්පීය නිපුණතාව ඉතා ඉහළ මට්ටමක පැවතී ඇත. එසේම වාරි තාක්ෂණය ඉගැන්වූ විශ්වවිද්‍යාලයක් ද පැවති බවට තොරතුරු හමු වේ. ජය ගඟ ඉදි කිරීමේ දී තැනිතලා බිමක වංගු සහිතව ඉදිකර ගලා යාමේ වේගය ලබා ගත් ආකාරය ප්‍රායෝගික ඥනයේ අග්‍ර ඵලයන් වේ. වැව් බැම්ම, බියෝ කොටුව, සැතපුමට අඟල් එකක බෑස්මආදිය එම වාරි තාක්‍ෂණ විශ්වවිද්‍යාලයේ ප්‍රතිඵල වේ. වියලි කලාපයේ විශාල දාගැබ් ඉදි කර සංවහන ධාරා ඉහළට යවා වර්ෂාව ලබා ගැනීමට කටයුතු කිරීමෙන් පෙනී යන්නේ ආකාශවස්තු විද්‍යා දැනුම ද මෙම විශ්වවිද්‍යාලවලින් ලබා දී ඇති බවයි. (ජයවර්ධන, 2015, පිටුව 22)

බටහිර පැවති ශිෂ්ඨාචාරවලට නොදෙවෙනි අධ්‍යාපන ක්‍රමයක් මෙරට පැවති බව මෙමගින් සනාථ වේ. මෙම විශ්වවිද්‍යාල වලින් ලබා දුන් උපාධි සහ ගරු නාම පිළිබඳ නිශ්චිත විස්තරයක් නොමැති වුවත්, විවිධ පැවිදි මහතෙරවරුන්ට සහ රජවරුන්ට මෙන්ම ගිහි පුද්ගලයන්ට ලැබී ඇති තනතුරු මගින් ඒ බව සනාථ වේ. මහේෂ්වරාචාර්ය, වාගීෂ්වර, කවිරාජ, කවිකාල සර්වඥ, මහාපාත්‍ර, කවිචක්‍රවර්ති, විද්‍යාපති, විද්‍යාචක්‍රවර්ති, සරස්වතී, සූර්යමණ්ඩල යනාදිය ඉන් කිහිපයකි.

අනාදිමත් කාලයක පටන් මෙරටට උරුම වූ දේශීය සභ්‍යත්වයක් සහිත ප්‍රාථමික, දිවිතියික සහ තෘතියික වශයෙන් වන විධිමත් දියුණු අධ්‍යාපන ක්‍රමයක් ක්‍රියාත්මක වී ඇත. එම අධ්‍යාපන ක්‍රමය හුදෙක් ශාස්ත්‍රීය කාර්යයක් පමණක් නොව සැබෑ ලෙසට උපයෝගීතාවයක් සහිතව භාවිතයේ යෙදවිය හැකි තමාටත් අනුන්ටත් වැඩ, හත සැලසූ ක්‍රමයක් ම විය. මේ නිසා පැරණි දේශීය අධ්‍යාපන ක්‍රමයට පවුලෙන්, කුලයෙන්, ආගමෙන්, රාජ්‍ය අනුග්‍රහයෙන් ලැබුණු සමබර දායකත්වය හේතුවෙන් සමෘද්ධිමත් දේශයක් වෙත ළඟාවිය හැකි විය. ඒ අනුව නූතන අධ්‍යාපන ක්‍රමය ද, අතීත ලක්‍ෂණ දෙස විමසිලිමත් වෙමින් වර්තමාන තත්වයට උචිත පරිදි ප්‍රතිසංස්කරණය කිරීමේ කාලෝචිත අවශ්‍යතාවයක් ද ඇතිබව කිව යුතුය.

# ආශ්‍රිත ග්‍රන්ථ


01. ජයවර්ධන ආනන්ද, (2015), ලංකාවේ පැරණි දේශීය අධ්‍යාපනය, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ

02. ජයවර්ධන කුමාරි, (2008), සොක්කන් ලොක්කන් වූ වගයි, සමාජ විද්‍යාඥයින්ගේ සංගමය, කොළඹ 05

03. ඩයස් හර්සන්, (2003), ජන සාහිත්‍ය සම්ප්‍රදාය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10

04. පීරිස් රැල්ෆ්, (1964), සිංහල සමාජ සංවිධානයඃ මහනුවර යුගය, විසිදුනු ප්‍රකාශන

05. විමලවංස බද්දේගම, (1988), පැරණි ලංකාවේ ගිහි අධ්‍යාපනය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10

06. හෙට්ටිආරච්චි එස්. බී, (2008), ලංකාවේ සමාජ හා සංස්කෘතික ඉතිහාසය, කර්තෘ, මහරගම